# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2318/35 – 2023 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා – 2023.02.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2019/105.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2021.05.06 දිනැති හා අංක 2226/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.05.03 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හඳගනාව, රන්දෙනිගල පාර, අංක 24/03 හි පදිංචි එස්. පී. රත්නායක මයා සහ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 038801 – 25 (2023/02)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

එස්. පී. රත්නායක මයා,
අංක 24/03 ,
රන්දෙනිගල පාර,
හඳගනාව.

*(පළමුවැනි පාර්ශ්වය)* - කිසිවෙක් පෙනී නොසිටී.

එදිරිව

යොමු අංකය: IR/COM/05/2019/105.
නඩු අංකය: A/51/2021

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

*වෙනුවෙන්*

දර්ෂණ සමරවික්‍රම සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ දමිත් සූරසේන පෙනී සිටින ලදී.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන පනත්වලින් සංශෝධනය වූ ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීම සමථයකට පත් කිරීම සඳහා 2021-05-03 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

**ආරාවුලට හේතු වී ඇති කරුණු -**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2021/04/30 එවා ඇති ලිපියේ දක්වෙන්නේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එස්. පී. රත්නායක ඔහුගේ වැඩ තහනම් කළ කාලයේ සිට නැවත සේවයට පැමිණි දින දක්වා ලැබීමට ඇති හිඟ වැටුප් මුදල වන රු. 1,121,763.39 ලබා ගැනීමටය. පරීක්ෂණයේදී මතු වූ කරුණු අනුව විෂමාචාරී ක්‍රියාවකට අසු වූ අයෙක් නම් ඔහුගේ වැඩ තහනම් කළ කාලයට වැටුප් වර්ධක ලබාදීම, වැටුප් වර්ධක හිමිකමක් නොවන අතර එය තමා උපයා ගත යුතුව ඇත. මෙයින් හැඟී යන්නේ ඔහුට අසාධාරණයක් වී ඇති බවත්, ඔහුගේ වැඩ තහනම් කාලයට අඩ වැටුප් නොගෙවීමත්ය.

**<u>පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය.</u>**

මෙම පරීක්ෂණය 2021.11.15 වැනි දින මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුළ සෑම දිනකම දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදී. වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි රජයේ නීති නිලධාරි දර්ශනී මහත්මිය වෙනත් නඩු කටයුත්තක් සඳහා බදුල්ල අධිකරණයේ පෙනී සිටීමට ඇති බැවින් පැමිණිය නොහැකි බැවින් වෙනත් දිනයක් ලබාදෙන ලෙසය. දෙපාර්ශ්වයේ එකඟතාවය අනුව 2021/11/22 ට කල් තබන ලදී. එදින පරීක්ෂණයෙන් පසු 2022/01/06 ට කල් තබන ලදී. මෙදින වග උත්තරකාර පක්ෂය නොපැමිණි නිසා එදින විභාගය 2022/01/25 වැනි දිනට කල් තබන ලදී. එම දිනට නොපැමිණියහොත් ඒකපාර්ශ්විකව තීන්දුවක් දීමට සිදුවන බවද දන්වන ලදී. 2022/01/25 වැනි දින දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදී. මෙදින වග උත්තරකාර පක්ෂයේ පැමිණිලිකරුගේ පුද්ගලික ලිපි ගොනුව නොගෙනා නිසා වෙනත් ප්‍රශ්න අසා 2022/02/17 වැනි දිනට කල් තබන ලදී. මෙදින දෙපාර්ශ්වයම පැමිණ සිටින ලදී. එදින පරීක්ෂණ පවත්වා 2022/03/16 වැනි දිනට කල් තබන ලදී. එදින පරීක්ෂණය නැවත කැඳවීම 2022/05/09 වැනි දිනට කල් තබන ලදී. එදින පැමිණි සාක්ෂිකාරිය ඇයගේ සෞඛ්‍ය තත්වය අනුව ඇයට සාක්ෂි දීමට නොහැකි තත්වයක සිටින ලදී. එම නිසා පරීක්ෂණය 2022/06/07 වැනි දිනට කල් තබන ලදී. මෙදින පරීක්ෂණය පවත්වා 2022/08/29 වැනි දිනට කල් තබන ලදී. එදින පරීක්ෂණයේදී දෙපාර්ශ්වයේම ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට ඉල්ලා සිටින ලදී. එම නිසා 2022/09/26

වැනි දිනට ඉදිරිපත් කරන ලෙසට දන්වන ලදී. නමුත් 2022/10/06 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අංක 2022/342/5188 දිගටම මෙම නඩුව ගෙන යැමට නිර්දේශ කරන ලදී. එම නිසා 2022/11/21 පරීක්ෂණය නැවත පවත්වා 2022/12/13 ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට දන්වන ලදී.

*ප්‍රදානය :*

1. පැමිණිලිකරු බදුල්ලේ අධිකරණයේ එදිරිව පැවති නඩු විභාගයෙන් ඔහු නිදොස් කොට නිදහස් කරන ලදී.

2. වග උත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි සාක්ෂිකරුවන් සියලුම දෙනා අසන ප්‍රශ්නවලට පිළිතුරු නොදී ''මතක නෑ'' ''දන්නේ නෑ'' යනුවෙන් උත්තර දීමය. මෙයින් පෙනීයන්නේ මෙවැනි උසස් තනතුරු දරන නිලධාරීන්ගේ අනුවනකම නොව නොදන්නා බව දන්වන ලෙස උපදෙස් දී තිබීමයි.

3. බදුල්ල මහාධිකරණයේ තීන්දුවෙන් පසු ඔහුව නැවත වැටුප් වර්ධක සමග සේවයේ පිහිටුවා ඇත. තවද ආයතනය මඟින් චෝදනා හතක් යටතේ ඔහුට චෝදනා පත්‍රයක් ලබා දී ඇත. එයින් ඔහු චෝදනා හයකින් නිවැරදිකරුවෙක් වී සිටින අතර හත්වැනි වරදට ඔහුව වැරදිකරු කර ඇත. කෙසේ නමුත් චෝදනා හයෙන් නිදහස් වී ඇත. ඒ අනුව හත්වැනි චෝදනාවෙන් ඔහු නිතැතින්ම නිදහස් වේ.

4. සාක්ෂි විමසීමේදී කිසිම වග උත්තරකාර පක්ෂයේ අයට, චෝදනා ලබා සිටි අයට වැටුප් වර්ධක ලබාදීම සඳහා පිළිතුරු දීමට නොහැකි වීමය. මෙයින් පෙනීයන්නේ පැමිණිලිකාර පක්ෂයට හිමි හිඟ වැටුප් ගෙවීම් මඟ හැරීමය.

5. පැමිණිලිකරුට ලබා දී ඇති 22/02/2018 දිනති අංක MA/ADM/10/02/1189 දරන ලිපියේ පසුපිටේ අවසාන ඡේදයේ දක්වා ඇති පරිදි ඔහුව නැවත සේවයේ පිහිටුවන ලද 2015/03/26 දින හිමි වැටුප වන රු. 14,985.00 ඒ අනුව එදින සිට 2017/02/18 දක්වා ඔහුට හිමි වැටුප් වර්ධකයන්හි පිහිටුවා හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

*ප්‍රදානය :*

1. පළමු වන පාර්ශ්වය ඉල්ලුම් කරන ලද හිඟ වැටුප් හා අනෙකුත් දීමනා සමඟ මුදල වන රුපියල් 1,121,763.39 පහත සඳහන් පරිදි ගෙවන ලෙසට දන්වා සිටිමි.

<u>ගෙවිය යුතු හිඟ වැටුප් හා දීමනා.</u>

මාසික වැටුප

| | | |
|---|---|---|
| මූලික වැටුප | - රු | 14,695.00 |
| විශේෂ දීමනා | - රු | 2,204.00 |
| ජීවන වියදම | - රු | 7,800.00 |
| අන්තර් දීමනා | - රු | 10,000.00 |
| විශේෂ දීමනා | - රු | 750.00 |
| මාසික වැටුප එකතුව | - රු | **35,449.00** |

| | | | |
|---|---|---|---|
| 2012.12.16 සිට 2012.12.31 දක්වා වැටුප - 1181.63 x දින 15 | = රු. | 17,724.45 | |
| 2012.12.16 සිට 2012.12.31 දක්වා E.P.F. 12% | = රු. | 2,136.90 | |
| 2012.12.16 සිට 2012.12.31 දක්වා E.T.F. 3% | = රු. | 534.24 | |
| ගෙවිය යුතු මුදල | | | = රු. 20,395.59 |
| 2013.01.01 සිට 2013.12.31 දක්වා වැටුප - 35,449.00 x මාස 12 | = රු. | 425,388.00 | |
| 2013.01.01 සිට 2013.12.31 දක්වා E.P.F. 12% | = රු. | 51,287.04 | |
| 2013.01.01 සිට 2013.12.31 දක්වා E.T.F. 3% | = රු. | 12,821.76 | |
| ගෙවිය යුතු මුදල | | | = රු. 489,496.80 |
| 2014.01.01 සිට 2014.12.31 දක්වා වැටුප - 35,449.00 x මාස 12 | = රු. | 425,388.00 | |
| 2014.01.01 සිට 2014.12.31 දක්වා E.P.F. 12% | = රු. | 51,287.04 | |
| 2014.01.01 සිට 2014.12.31 දක්වා E.T.F. 3% | = රු. | 12,821.76 | |
| ගෙවිය යුතු මුදල | | | = රු. 489,496.80 |

| | | | |
|---|---|---|---|
| 2015.01.01 සිට 2015.03.31 දක්වා වැටුප - 35,449.00 x මාස 03 | = | රු. | 106,347.00 |
| 2015.01.01 සිට 2015.12.31 දක්වා E.P.F. 12% | = | රු. | 12,821.76 |
| 2015.01.01 සිට 2015.12.31 දක්වා E.T.F. 3% | = | රු. | 3,205.44 |
| ගෙවිය යුතු මුදල | = | රු. | 122,374.20 |
| ගෙවිය යුතු මුළු මුදල | = | රු. | 1,121,763.39 |

2. විනය පරීක්ෂණයක් අවසානයේ දඬුවම් ලබන රජයේ නිලධාරියෙකුගෙන් වාර 15 ක් අය කර ගන්නා ලද මුදල් වන රු. 30,000.00 2011/12/21 දිනැති අංක 29/2017 දරන චක්‍රලේඛනය අනුව අය කරගත් මුදල 2017/02/27 වැනි දින අංක 29/2011 (11) දරන චක්‍රලේඛනයෙන් අවලංගු කර ඇත. එම නිසා එම මුදල ද පළමුවන පාර්ශ්වයට ලබා දිය යුතු වේ.

3. රුපියල් 1,121,763.39 සහ අය කරගත් රු 30,000.00 මුදල හැර අමතර කිසිදු මුදලක් කිසිම පාර්ශ්වයකට හිමි නොවේ. තවද බේරුම්කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශ්වයකින් තවත් පාර්ශ්වයකට හිමි නොවේ.

4. එම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් 1,151,763.39 ( එකොළොස් ලක්ෂ පනස් එක් දහස් හත්සිය හැටතුනයි ශත තිස් නවයක්) මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් නමින් තැන්පත් කරන ලෙසට මෙයින් නියෝග කරමි. මෙම ප්‍රදනය රජයේ *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට මසක් ඇතුළත තැන්පත් කළ යුතුය. මෙය සාධාරන හා යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

**කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්,**
බේරුම්කරු.

2022 ක් වූ දෙසැම්බර් මස 26 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

EOG 02 - 0084

---

මගේ අංකය: IR/COM/02/2017/212.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.08.17 දිනැති හා අංක 2084/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.08.08 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අම්බලන්තොට, පල්ලෙරොට - මාමඩල, දියවර ගම්මානය හි පදිංචි කේ. එච්. සුනීත මයා සහ කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 212/1 හි පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 20 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

බේරුම්කරු ඕබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිට දී ය.

කේ. එච්. සුනීත මයා,
දියවර ගම්මානය,
පල්ලෙරොට- මාමඩල,
අම්බලන්තොට

*(පළමු පාර්ශ්වය)*

ගොනු අංකය - IR/COM/02/2017/212
බේරුම්කරණ අංකය - A/58/2018

එදිරිව

මධ්‍යම සංස්කෘතික අරමුදල,
අංක 212/1,
බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවත්නා කාර්මික ආරාවුල.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්ව අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදේශක රියදුරකු ලෙස සේවය කරන කේ. එච්. සුනීත මහතාව, රියදුරු තනතුරේ ස්ථිර නොකිරීම යුක්ති සහගතද? එසේ නොවන්නේ නම් එම සේවකයාට හිමිවිය යුතු සහන මොනවාද? යන්න පිළිබඳව වේ."

**පෙනී සිටීම -**

පළමු පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ ශ්‍රීනාත් පෙරේරා මහතා, නීතිඥ ටයිටස් පත්මසිරි මහතා.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් - ආයතනය වෙනුවෙන් ප්‍රධාන ලිපිකාරිනී එම් සුනේත්‍රා සිල්වා මහත්මිය.

රජයේ නීතිඥ සාලින්ද කුරියන් මහතා රජයේ නීතිඥ ගංගානි උක්වත්තගේ මහත්මිය පෙනී සිටී.

**ආරාවුලට හේතුපාදක වූ පසුබිම.**

ඉල්ලුම්කරු 2002-10-01 දින අනියම් කම්කරුවකු වශයෙන් සේවයට බැඳී පසුව ස්ථිර කම්කරුවකු වශයෙන් සේවය ස්ථිර කිරීමෙන් අනතුරුව 2005-07-09 දින සිට ආදේශක රියැදුරු තනතුරකට අනුයුක්ත කර දිගින් දිගටම එම ආදේශක රියැදුරු තනතුරේ සේවය කළද, ඔහුට ස්ථිර රියැදුරු තනතුරක් ලබා නොදීම මෙම ආරාවුලට හේතුපාදක වී ඇත. මෙම ඉල්ලුම්කරු සුදුසුකම් සැපිරීමෙන් පසු දිගින් දිගටම ආදේශක, අනියම් හා ආරක්ෂක සේවාවේ නියුතුව සිටි පුද්ගලයන් මෙන්ම බාහිර පුද්ගලයින් ද, රියැදුරු තනතුරු සඳහා බඳවාගෙන ඇතත් මොහුට එම තනතුර දිගින් දිගටම ලබා නොදීම ආරාවුලට හේතු පාදක වී ඇත.

**ප්‍රදානය ලබාදීමට හේතුපාදක වූ කරුණු.**

දෙපාර්ශ්වය විසින්ම තම පළමු ප්‍රකාශය බේරුම්කරණය වෙත යොමු කර ඇති අතර, දෙවැනි පාර්ශ්වය විසින් සිය පළමු ප්‍රකාශය ලබාදී ඇත්තේ බොහෝ ප්‍රමාද වී වේ. එම ප්‍රකාශයට යා කර ඇති ශිෂ්‍ය කාර්ය දර්ශකයට අනුව ඉල්ලුම්කරු 6 වසර දක්වා අධ්‍යාපනය ලැබුන බව දක්වමින් දෙවැනි පාර්ශ්වයේ වාර්තාව සකස්කර තිබුනි.

මෙම ප්‍රදානය ලබාදීමේදී මෙම බේරුම්කරණය ඉදිරියේදී ඉදිරිපත් වූ සාක්ෂි සහ දෙපාර්ශ්වය විසින් මෙම බේරුම්කරණ විභාගය අවසන්වීමෙන් අනතුරුව ලබාදුන් ලිඛිත දේශණ මෙන්ම අදාළ සලකුණු කරන ලද ලේඛන ද එමෙන්ම බේරුම්කරණ විභාගය අතරතුර දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත්කරන ලද විවිධ තොරතුරු අඩංගු ලේඛනද පරීක්ෂාවට ලක්කරන ලදී. මෙහිදී මාගේ විශේෂ අවධානයට ලක්වූ කරුණක් වනුයේ දෙවැනි පාර්ශ්වය සිය අවසාන ලිඛිත දේශණ සමග මෙම බේරුම්කරණ විභාගයේදී සලකුණු කරන ලද එකදු ලේඛනයක් ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කර නොතිබීමයි. එහෙත් පසුව ඔවුන් එම සලකුණු කරන ලද ලේඛන බේරුම්කරන ගොනුව වෙත ගොනුකර තිබුනි. මේ පිළිබඳ විමසා බැලීමේදී ඉතා වැදගත් කරුණක් මාගේ නිරීක්ෂණයට ලක්විය. එනම් දෙවැනි පාර්ශ්වයේ අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත් සංවර්ධන) රියර් අද්මිරාල් ඩේමියන් ප්‍රනාන්දු ( විශ්‍රාමික) විසින් 2018-12-03 දිනැතිව ඉදිරිපත් කර තිබූ සිය ප්‍රකාශයට අමුණා ඇති පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුගේ ශිෂ්‍යයන්ගේ කාර්ය දර්ශනය මගින් මෙම ඉල්ලුම්කරු 6 වසර දක්වා පමණක් අධ්‍යාපනය ලද බවට සහතික කර තිබීමත් පසුව බේරුම්කරණ විභාගයේදී R2 ලෙසට ඉදිරිපත් කර තිබූ මෙම ඉල්ලුම්කරුගේ ශිෂ්‍යයන්ගේ කාර්ය දර්ශණයට (ආයතනයේ පෞද්ගලික ලිපිගොනුවේ තිබූ) අනුව මෙම ඉල්ලුම්කරු 9 වසර දක්වා අධ්‍යාපනය හදාරා ඇති බවට හෙළිදරව්වීම දැඩි සැකයට තුඩුදුන් කරුණක් වේ. එනම් දෙවැනි පාර්ශ්වය විසින් හිතා මතාම මෙම ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ව්‍යාජ තොරතුරු ඉදිරිපත්කොට මෙම බේරුම්කරණය නොමග යැවීමට උත්සාහ ගත්තාද යන සැකය මා හට ජනිත විය. මෙම ඉල්ලුම්කරු 9 වසර දක්වා ඉගෙන ගත් බවට ඔහුගේ සාක්ෂියෙන් මෙසේ ලබාදී ඇත. ගොනුවේ සාක්ෂි සටහන්වල 2019-07-03 දින සාක්ෂි සටහන්වල 2 පිටුව එනම් ගොනුවේ 138 වන පිටුවෙහි පහළ සිට ඉහළට දෙවැනි ප්‍රශ්නය -

"ප්‍ර. එතකොට සාක්ෂිකරු මේ ආර් - 2 වශයෙන් ලකුණු කළ ලේඛනය තමයි තමන්ගේ අධ්‍යාපන සුදුසුකම් සඳහන් වන ලේඛනය?

පි. ඔව් ආර්.2

ප්‍ර. එතකොට ආර්-2 (ඒ) ලේඛනය අනුව තමන් බැඳිගම්තොට විදුහලේ 09 වන වසර දක්වා අධ්‍යාපනය ලබලා තියෙනවා කියලා සඳහන් වෙලා තියෙනවද?

පි. ඔව්''

ඉහත සාක්ෂි දෙස බැලීමේදී දෙවැනි පාර්ශ්වයේ සේවායෝජක විසින්ම සලකුණු කරමින් ඉදිරිපත් කර තිබූ ආර්-2 ලේඛනය මගින් මෙම ඉල්ලුම්කරු 9 වසර දක්වා අධ්‍යාපනය ලද බවට එකී ලේඛනය සාක්ෂි දරා ඇත. එහෙත් තම පළමු ප්‍රකාශය මගින් මෙම ඉල්ලුම්කරු 6 වසර දක්වා ඉගෙනුම ලබා ඇති බවට සනාථ කිරීමට උත්සාහ කිරීමේ අරමුණ මොහුට යම් සහනයක් ලැබීම වැලැක්වීම බව පැහැදිලිවේ. එපමණක් නොව මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු විසින් 2015 ඉදිරිපත්කර තිබූ ස්ථිර රියැදුරු සඳහා වන අයදුම්පතෙහි අධ්‍යාපන සුදුසුකම් ලෙසට 6 වසර දක්වා ඉගෙනුම් ලැබූ බවට සටහන් කර තිබීම මෙන්ම ඉල්ලුම්කරු විසින් මෙම ඉල්ලුම්පතෙහි තමන් සඳහන් කළේ 9 වසර දක්වා සමත් බව යන්න පවසා සිටීම පිළිබඳවද යම් සැකයක් පහලවනුයේ ආයතනය හිතා මතාම මෙම සේවකයාහට යම් සහනයක් ලබාදීම වළක්වාලීමට දරණ ලද උත්සාහයක් වශයෙනි.

මේ පිළිබඳ තවදුරටත් සාක්ෂි විමසීම් වලදී මනාව තහවුරු වී ඇති බව සාක්ෂි සටහන් සහ ලේඛන සියුම්ව නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි විය. ගොනුවේ පිටු අංක 213 හී එනම් දෙවැනි පාර්ශ්වය වන ආයතනයේ පරිපාලන නිලධාරිනිය විසින් සහතික කොට මා වෙත ඉදිරිපත් කරන ලද ලේඛනයෙහි අංක 46 යටතේ නම සඳහන් එච්.ජී.සරත් හතුරුසිංහ (ආරක්ෂක නියාමක) මහතා 5 ශ්‍රේණිය සමත් බවටත් 2013-01-01 දින සිට රියැදුරු තනතුර ලබාදී ඇති බවටත් සටහන් වන අතර, R 4 (A 20 ඒ) ලෙස සටහන්ව ඇති බඳවාගත් රියැදුරු ලේඛනයෙහි ඉහතකී පුද්ගලයාගේ අධ්‍යාපන සුදුසුකම් ලෙසට අපොස (සා.පෙ) විෂයන් 2ක් සමත්ව ඇති බවට පරස්පර ලෙසට තොරතුරු සටහන්කර ඇත.

තවදුරටත් මෙම සාක්ෂි පිළිබඳව නිරීක්ෂණය කරන විට පෙනී යන කරුණක් වනුයේ ආයතනය මෙම ඉල්ලුම්කරු සම්බන්ධයෙන් දිගින් දිගටම පවසා සිටියේ නව බඳවා ගැනීමේ පටිපාටියට අනුව මොහු සුදුසුකම් ලබා නොමැති බැවින් ස්ථිර රියැදුරු තනතුරක් ලබාදීමට හැකියාවක් නොමැති බවයි. නමුත් පත්වීම් ලබාදී ඇති රියැදුරු නාම ලේඛනය පරීක්ෂා කිරීමේදී මෙන්ම සාක්ෂි විමසීම්වලදී ද පැහැදිලි වන කරුණු රාශියක් ඇත. එනම් 2006 න් පසු 2015 වන තෙක් අයදුම්පත් නොකැඳවා ආයතනයේ ඉහළ කළමනාකාරිත්වයට මනාප පරිදි රියැදුරු පත්වීම් ලබාදී ඇති බවයි. එසේ 2008 සිට 2013 දක්වා කාලය තුළ බඳවා ගැනීමේ පටිපාටියෙහි සඳහන් සුදුසුකම් නොලත් කිහිප දෙනෙක්ම ස්ථිර රියැදුරන් ලෙසට පත් කර ඇත. උදා. R 4 ලේඛනයෙහි අනු අංක 44 යටතේ 2008-01-01 දින සිට පත්වීම් ලත් ආර්. ජයතිස්ස නමැති අයගේ අධ්‍යාපන සුදුසුකම් වනුයේ 6 ශ්‍රේණිය සමත්වීම වේ. A 22 ලෙසට සලකුණුකර ඉදිරිපත්කර ඇති ශිෂ්‍යයන්ගේ කාර්ය දර්ශණයට අනුව මේ බව සනාථ වේ. එම ලේඛනයේම අනු අංක 48 යටතේ නම සඳහන් ආර්.පී.ජයන්ත රාජපක්ෂ (නුපුහුණු කම්කරු) 10 වසර දක්වා පමණක් අධ්‍යාපනය ලද අයෙකි. එනම් අවසන් වරට සමත්වී ඇත්තේ 9 වසර වේ. ඔහුට 2012-11-01 සිට ස්ථිර රියැදුරු පත්වීමක් ලබාදී ඇත. තවද, එම ලේඛනයේම අනු අංක 52 යටතේ නම සඳහන් ජී.ආනන්ද විජය ගුණසේකර (ආරක්ෂක නියාමක) යන අයද අ.පො.ස. (සා.පෙ.) විෂයයන් 1ක් පමණක් සමත්ව ඇතත්, ඔහුටද 2013-01-01 දින සිට ස්ථිර රියැදුරු තනතුරු ලබාදී ඇත.

දෙවැනි පාර්ශ්වයේ සාක්ෂිකරුවන් සාක්ෂි ලබාදෙමින් දිගින් දිගටම පවසා සිටියේ මෙම පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුට නිසි අධ්‍යාපන සුදුසුකම් නොමැති බැවින් ස්ථිර රියැදුරු පත්වීමක් ලබා දිය නොහැකි බවයි. නමුත් විවිධ කොන්දේසි පනවමින්, විවිධ හේතු දක්වමින් ඔවුනට අවශ්‍ය සේවකයන්හට රියැදුරු තනතුරු ලබාදී ඇති බව මනාව තහවුරු වී ඇත. උදාහරණයක් ලෙස A 24 ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇති මාණ්ඩලික පත්‍රිකාව මගින් රියැදුරු තනතුර සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් පිළිබඳ ව නොසලකා ඔවුන් වසර 10කට වැඩියෙන් සේවය කළ බවට හේතු දක්වමින් 5 සහ 6 වසර සමත් තිදෙනෙකු රියැදුරු තනතුරු සඳහා බඳවාගෙන ඇත. මේ එකදු අවස්ථාවක හෝ ඉල්ලුම්පත් කැඳවූ බවට කිසිඳු සාක්ෂියක් ඉදිරිපත් නොවූ අතර, සියල්ලම මාණ්ඩලික පත්‍රිකා මගින් පිරිනමන ලද රියැදුරු තනතුරු බවට දෙවැනි පාර්ශ්වය ඉදිරිපත්කර ඇති ලේඛනය අනුව තහවුරු වේ. පළමු පාර්ශ්වය විසින් ඔවුන්ගේ ලිඛිත දේශණවල අමුණා ඇති R 22 ලේඛනය (මාණ්ඩලික පත්‍රිකාව) සියුම්ව නිරීක්ෂණය කර බැලීමේදී එහි අඩංගු යම් යම් කරුණු සත්‍යයෙන් තොර බව පෙනී යයි. එම මාණ්ඩලික පත්‍රිකාව ඉදිරිපත් කර ඇත්තේ ආර්. පී. ජයන්ත රාජපක්ෂ යන අය රියැදුරු තනතුරෙහි ස්ථිර කිරීම සඳහා වේ. ඔහු ආදේශක රියැදුරකු ලෙසට පත්කර ඇත්තේ 2005-09-26 දින සිට බව එහි දෙවැනි ඡේදයේ අවසාන පේළියෙහි දක්වා ඇත. ඔහු 2006-04-25 දින රියැදුරන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී ඇත. එහෙත් මෙම මාණ්ඩලික පත්‍රිකාව ඉදිරිපත්කර ඇත්තේ 2012-10-25 දින වේ. සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී වසර හයකටත් වඩා අධික කාලයක් ඉක්ම ගොස් ඔහු විසින් ඉදිරිපත්කළා යැයි කියනු ලබන ඉල්ලීමකට අනුව ඔහු රියැදුරු තනතුරට පත්කර ඇත. එකී මාණ්ඩලික පත්‍රිකාවේ පළමු ඡේදයෙහි 5 වන පේළියෙහි මෙසේ සටහන් වේ.

"............................. ආර්. පී. ජයන්ත රාජපක්ෂ මහතා සුදුසුකම් සපුරා තිබියදීත් ඔහු රියැදුරු III ශ්‍රේණියට පත්නොකිරීමෙන් බලවත් අසාධාරණයකට ලක් වී ඇත."

මෙම අවස්ථාව වන විට නව බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වී ඒ අනුව මෙම ආයතනයේ බඳවා ගැනීම් කරන බවත් ඉන් පිටත කිසිදු බඳවා ගැනීමක් කළ නොහැකි බවද ආයතනය වෙනුවෙන් ඉදිරිපත් වූ සාක්ෂිකාරියක් විසින් ප්‍රකාශකොට ඇත. එසේ නම් රාජපක්ෂ මහතා එම බඳවා ගැනීමේ පටිපාටියට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබේ යනුවෙන් සටහන් කරමින් බඳවා ගැනීම සිදුකර ඇත්තේ ඇත්ත වශයෙන්ම අදාළ සුදුසුකම් සපුරා නොතිබියදී බව මනාව පැහැදිලි වේ. ඔහු සමත් වී ඇත්තේ 9 වසර පමණි. 10 වසර දක්වා ඉගෙනුම ලැබූ බවට ඔහුගේ සුදුසුකම් ඉදිරියෙහි R4 ලේඛනයෙහි ආයතනය විසින්ම සහතික කර ඇත. එහෙත් නව බඳවා ගැනීමේ පටිපාටියට අනුව අ.පො.ස. (සා.පෙ.) විෂයයන් දෙකක් සමත්විය යුතු බවට නියමයක් ඇත. එසේ තිබියදීත් එය නොසලකා මෙම පුද්ගලයා පත්වීම සඳහා නිර්දේශ කර ඇත්තේ අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත යනුවෙනි. එය අදාළ මාණ්ඩලික පත්‍රිකාවේ 3 වන ඡේදයේ මෙසේ සටහන් කර ඇත.

"ආර්.පී.ජයන්ත රාජපක්ෂ මහතා රියැදුරු III ශ්‍රේණියට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් ද සම්පූර්ණ කර ඇති බැවින්............"
ඉහත තොරතුරු අනුව සලකා බැලීමේදී මෙය කළමනාකාරිත්වයේ අවශ්‍යතාවය මත ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කරමින් සිදු කර ඇති පත්වීමක් බව මනාව පැහැදිලි වේ.

පහත නම් සඳහන් සේවකයන් රියැදුරු III ශ්‍රේණියට පැරණි බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් සපුරා නොමැතිව බඳවාගෙන ඇත. (R 4 ට අනුව)

01. අනු අංක 44 ආර්.ජයතිස්ස 6 ශ්‍රේණිය සමත් 2008-01-01 සිට 175 වැනි පාලක මණ්ඩල අනුමැතිය යටතේ.

නව බඳවා ගැනීමේ පටිපාටිය යටතේ සුදුසුකම් නොලත් පහත සේවකයන් රියැදුරු තනතුරෙහි පිහිටුවා ඇත.

01. අනු අංක 48 - ආර්.පී.ජයන්ත රාජපක්ෂ 10 වසර දක්වා - 2012-11-01 දිනැති 186.30.01 පාලක මණ්ඩල අනුමැතිය යටතේ,

02. අනු අංක 52 - ජී. ආනන්ද විජේගුණසේකර (ආරක්ෂක නිලධාරි) අ.පො.ස. (සා.පෙ.) එක් විෂයක් පමණක් සමත් - 2013-01-01 දිනැති 187.11.01. පාලක මණ්ඩල අනුමැතිය යටතේ

ඉහත ආකාරයෙන් දිගින් දිගටම 2013 දක්වාම කිසිදු සාධාරණ පදනමකින් තොරව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සේවකයින් බොහෝ සංඛ්‍යාවක් 1991 සිට 2013 දක්වාම රියැදුරු තනතුරු සඳහා බඳවා ගෙන ඇති බව පෙනේ. මේ බවට දෙවැනි පාර්ශ්වයේ සාක්ෂිකාරියන් දෙදෙනාම තහවුරු කර ඇත.

2022-02-23 සාක්ෂි සටහන්වල 2 පිටුවෙහි සහ 3 පිටුවෙහි ආරම්භක ඡේදය මෙසේ පිළිතුරු ලබාදී ඇත.

''පි. ස්වාමීනී මෙහෙම ප්‍රශ්නයක් වෙලා තියෙනව මේ අය බඳවාගෙන තියෙන්නේ 2013 ට කලින් එස්. ඕ. ආර්. එකට පිටින් ගිහිල්ල බඳවා ගැනීම් සේරම කරල තියෙන්නේ.......''

එදිනම සාක්ෂි සටහන්වල 3 පිටුවෙහි පහළ සිට ඉහළට 3 වන ප්‍රශ්නය.

"ප්‍ර. මෙහෙම සුදුසුකම් කොහෙද තිබුනේ එස්. ඕ. ආර්. එකේ?

පි. එස්. ඕ. ආර්. එක අභිබවා ගිහිල්ල තමයි ස්වාමිණි.''

සියලුම සාක්ෂි සටහන් හා ලේඛන සියුම් නිරීක්ෂණය කිරීමේදී 2008 වන විට සුදුසුකම් සපුරා තිබූ මෙම ඉල්ලුම්කරු රියැදුරු III ශ්‍රේණියට බඳවා ගැනීමට අවකාශ තිබියදීත් 2015 වනතෙක් අයදුම්පත් නොකැඳවා මෙම ඉල්ලුම්කරු සුදුසුකම් සපුරා ඇති 2008 සිට 2013 දක්වා විවිධ තර්ක ඉදිරිපත් කරමින් මෙම ඉල්ලුම්කරුට වඩා අඩු සුදුසුකම් සහිත පුද්ගලයින් පවා පැරණි හා නව බඳවා ගැනීමේ පටිපාටි දෙකම උල්ලංඝණය කරමින් රියැදුරන් ලෙස බඳවා ගෙන ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම සේවකයාට අගතියක් සිදුවී ඇති බව මනාව පැහැදිලි වේ.

**ප්‍රදානය**

දැන් සලකා බැලිය යුත්තේ මා වෙත යොමුකර ඇති බේරුම්කරන යොමුවේ සඳහන් ප්‍රශ්නයට දිය යුතු පිළිතුර කුමක් ද යන්නයි. ඒ අනුව බේරුම්කරන යොමුව මෙසේ වේ.

"මධ්‍යම සංස්කෘතික අරමුදලේ ආදේශක රියැදුරකු ලෙස සේවය කරන කේ. එච්. සුනීත මහතාව, රියැදුරු තනතුරේ ස්ථිර නොකිරීම යුක්ති සහගතද?"

ඉහත සියලුම කරුණු සලකා බැලීමේදී හා ඉහතින් දක්වා ඇති හේතුවලට අනුව ලබාදිය හැකි එකම පිළිතුර වන්නේ
"යුක්ති සහගත නොවේ ය යන්න වේ"

ඊළඟට සලකා බැලිය යුත්තේ එසේ යුක්ති සහගත නොවන්නේ නම් හිමිවිය යුතු සහන මොනවාද යන ප්‍රශ්නයට පිළිතුරු ලබාදීමයි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමේදී විශේෂයෙන් මෙම ආයතනයේ පැවැත්ම හා මූල්‍ය තත්ත්වය පිළිබඳව සලකා බැලීම කළයුතුවේ. මන්ද යත් කාර්මික නීතියේදී සේවායෝජක හා සේවකයා යන දෙපාර්ශ්වය කෙරෙහිම සමානව සලකා බලමින් ආයතනයේ පැවැත්ම කෙරෙහි ද අවධානය යොමු කරමින් සහන ලබාදීම වඩාත් සුදුසු සහ සාධාරණ ක්‍රමය මෙන්ම ඉහළ අධිකරණවල ලබාදී ඇති නඩු තීරණ වලදීද නියම කර ඇති ක්‍රමවේදයක් වන බැවිනි. යම් ආකාරයකින් මෙම සේවකයා මෙම තනතුරට සුදුසුකම් ලැබූ දිනයේ සිට හිඟ වැටුප් ගෙවන ලෙසට නියමයක් සිදුකළ හොත් ඉන් ආයතනයේ මූල්‍ය තත්ත්වයට අගතියක් සිදුවනවා පමණක් නොව, එය ආදර්ශයට ගනිමින් වෙනත් සේවකයන් ද එසේ හිඟ වැටුප් ඉල්ලා සිටීමට ඉඩකඩ ඇති හෙයින්, ඒ තුළින් ආයතනය දැඩි මූල්‍ය අර්බුදයක් කරා තල්ලුවීමට ඉඩ ඇති බැවිනි. ඒ අනුව මාගේ ප්‍රදානය දෙපාර්ශ්වයම පිළිබඳව සාධාරණ හා යුක්ති සහගතව සලකා බලා දෙපාර්ශ්වයටම අගතියක් නොවන පරිදි පහත පරිදි මාගේ ප්‍රදානය සටහන් කරමි.

1. මෙම ඉල්ලුම්කාර සේවකයා ආදේශක රියැදුරු තනතුරේ වසර 3 ක් සම්පූර්ණ කරනු ලබන 2008-07-09 දින සිට බල පැවැත්වෙන පරිදි හිඟ වැටුප් රහිතව රියැදුරු III ශ්‍රේණියෙහි ස්ථිර කරන ලෙසට නියම කරමි.

2. තව ද, රියැදුරු III ශ්‍රේණියේ වසර 10 ක සේවයෙන් පසු එනම් 2018-07-09 දින සිට බල පැවැත්වෙන පරිදි රියැදුරු II ශ්‍රේණියට උසස් කිරීමට නියම කරමි.

3. මෙසේ රියැදුරු තනතුරෙහි ස්ථිර කිරීමේදී ඔහුට නියමිත වැටුප් පරිමාණයෙහි පිහිටුවා ආයතන සංග්‍රහයෙහි ප්‍රතිපාදන වලට අනුගතව හා නියමිත වැටුප් චක්‍රලේඛවලට අදාළව නියමිත වැටුප් පියවරෙහි තබන ලෙසට නියම කරමි.

4. මෙම සේවකයා හිඟ වැටුප් රහිතව රියැදුරු සේවයේ ස්ථිර කිරීමට නියම කර ඇති බැවින් හිඟ වැටුප් සම්බන්ධයෙන් ප්‍රදානයක් නොකරමි.

5. ඒ අනුව මෙම සේවකයා රියැදුරු සේවයේ ස්ථිර කොට අදාල පත්වීම් ලිපිය හා නියමිත උසස්වීමට අදාල ලිපි ලබා දී මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකල දින සිට මසක් ඇතුලත ඒ බව සනාථ කිරීම සඳහා අදාල පත්වීම් ලිපියේ සහ උසස්වීම් ලිපියේ සහතික පිටපත් මැද කොළඹ සහකාර කම්කරුකොමසාරිස් වරයා වෙත ඉදිරිපත් කිරීමට ද පියවර ගන්නා ලෙසට මෙයින් නියම කරමි.

6. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රධානයක් බවට සහතික කරමි.

නීතිඥඕබඩගේ ලීලාරත්න
බේරුම්කරු

2022 දෙසැම්බර් මස 12 වැනි දින දී ය.

EOG 02 - 0085

---

*මගේ අංකය* : IR/COM/02/2016/62.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.01.26 දිනැති හා අංක 2212/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, බ්‍රාහ්මණගම, අංක 183/ඒ/2 හි පදිංචි පී. ටී. රංජිත් මයා සහ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක 170 හි පිහිටි ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.12.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජනවාරි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරු අරුණ කාන්ත ජයකොඩි මැතිතුමා ඉදිරිපිට දී ය.

ගොනු අංකය : IR/COM/02/2016/62.
බේරුම්කරණ අංක : A/09/2021.

පී. ටී. රංජිත්,
අංක. 183/ඒ/ 2,
බ්‍රාහ්මණගම,
පන්නිපිටිය.

*(පළමු පාර්ශ්වය)*

එදිරිව

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
අංක. 170,
හයිලෙවල් පාර,
නුගේගොඩ.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවත්නා කාර්මික ආරාවුල.

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම් කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ, ''ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවක පී. ටී. රංජිත් මහතා විශ්‍රාම පූර්ව නිවාඩු ලබා නොගෙන සේවය කරන ලද මාස තුනක කාලය සඳහා වැටුපට අමතරව ආයතනය විසින් ලබා දෙන මාස තුනක වැටුප ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද ? යන්නත් පිළිබඳව වේ"

**පෙනී සිටීම**

ඉල්ලුම්කාර පලමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිතයා ලෙස එම්. කේ. හේමපාල මහතා පෙනී සිටී.

දෙවන පාර්ශ්වකාර ආයතනය වෙනුවෙන් මාණ්ඩලික සහකාර එස්, එම්. එම්. සිල්වා මහතා සහ පරිපාලන නිලධාරී එච්. එච්. ආර්. කේ. හේරත් මහත්මිය පෙනී සිටී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ උපුල් ප්‍රනාන්දු මහතා පෙනී සිටී.

**පසුබිම**

පළමු පාර්ශ්වකරු 2000 ඔක්තෝබර් 02 වැනි දින සිට දෙවන පාර්ශ්වකාර ආයතනයේ 6 වන ශ්‍රේණියේ ඖෂධවේදී තනතුරට බඳවාගෙන ඇත. ඔහු 2007.10.26 දින සිට හතර වන ශ්‍රේණියට උසස්වීම් ලබා සිට 2016 වසරේ ජනවාරි මස පස්වන දින සිට සේවයෙන් විශ්‍රාම ලබා ඇත.

දෙවන පාර්ශ්වකාර ආයතනය ආරම්භයේ සිට විධායක නිලධාරීන් විශ්‍රාම ගන්වන අවස්ථාවේදී ඔවුන්ට මාස තුනක වැටුප් සහිත විශ්‍රාම පූර්ව නිවාඩු හෝ ආයතන අවශ්‍යතාව මත එකී මාස තුනක කාලය සේවයේ යොදවන්නේ නම් ඒ සඳහා මාස 3ක වැටුප් ගෙවීමේ ක්‍රමවේදයක් පිළිගෙන ක්‍රියාත්මක වී ඇත. ඒ අනුව තමන්ටද විශ්‍රාම පූර්ව නිවාඩු නොලබා රාජකාරි කිරීම වෙනුවෙන් මාස තුනක වැටුප් ලබාදෙන ලෙස පළමු පාර්ශ්වකරු විසින් ලිඛිත ඉල්ලීමක් සිදුකොට එකී ඉල්ලීම 2015.01.13 දින එවකට සිටි සභාපතිවරයා විසින් අනුමත කර ඇත.

එහෙත් පළමු පාර්ශ්වකරු එලෙස විශ්‍රාම පූර්ව නිවාඩු නොලබා රාජකාරි කිරීම වෙනුවෙන් අමතර මාස තුනක වැටුප ආයතනය විසින් ගෙවා නොමැති බවට චෝදනා කරමින්, තමන්ට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් සහන ලබා දෙන ලෙස කම්කරු කොමසාරිස් වරයාගෙන් කරන ලද ඉල්ලීමට අනුව මෙම ආරාවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරණය වෙත යොමු කර ඇත.

පූර්වගාමී බේරුම්කාර තුමන්ලා හමුවේ අඩක් විභාග කිරීමෙන් අනතුරුව ආරාවුල මා වෙත යොමු කරන ලද අතර, පූර්වගාමී බේරුම්කාරතුමන්ලා හමුවේ පවත්වාගෙන යනු ලැබූ විභාගය එතැන් සිට ඉදිරියට කරගෙන යාමට පාර්ශ්වකරුවන් එකඟ වන ලදී.

කෙසේ වුවද, විභාගය ආරම්භ කිරීමෙන් පසු පළමු පාර්ශ්වකරු බේරුම්කාර අධිකරණය හමුවේ පැමිණ සාක්ෂි දීමට නොහැකි ආකාරයෙන් දැඩි ලෙස රෝගාතුර වීම හේතුවෙන් ලිඛිත සැල කිරීම් මත ප්‍රදානයක් ලබා ගැනීමට දෙපාර්ශ්වය එකඟ වන ලදී. ඒ අනුව දෙපාර්ශ්වයටම සියලු සාක්ෂි සම්පිණ්ඩනය කරමින් මූලික සැලකිරීමක් සිදුකිරීමටත් එකී ලිඛිත සැලකිරීම්වල දෙපාර්ශ්වයේ කරුණු මත ප්‍රති පිළිතුරු සැපයීමටත් අවස්ථාව ලබා දුනිමි.

ඉන් අනතුරුව අවසන් ලිඛිත දේශන ගොනු කිරීමට නියමිතව තිබියදී පළමු පාර්ශ්වකරු මිය යන ලදී.

ඒ අනුව ආරාවුල සම්බන්ධ ඉදිරි කටයුතු සඳහා පළමු පාර්ශ්වකරුගේ බිරිඳ වන මීවනගේ විනීතා පද්මිණී පෙරේරා යන අය ආදේශ කිරීම සඳහා ලේඛන පළමු පාර්ශ්වයේ නියෝජිත තැන විසින් ගොනු කරන ලද අතර ඊට විරෝධතා සහිතව දෙවන පාර්ශ්වය විසින් අවසන් ලිඛිත දේශන ගොනුකොට ඇත.

**ප්‍රදානය**

දැන් මෙම බේරුම්කරණය ට යොමු වී ඇති කරුණ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ ලිඛිත හා වාචික සාක්ෂි පිළිබඳව අවධානය යොමු කරමින් යුක්ති සහගත හා සාධාරණ තීරණයක් ලබා දීම බේරුම්කරු වන මාගේ යුතුකම වේ.

මෙහිදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද විරෝධතාව පිළිබඳව මාගේ පළමු අවධානය යොමු කරන අතර මියගිය පළමු පාර්ශ්වකරු වෙනුවට තමන් ආදේශ කරන ලෙසට ඔහුගේ බිරිඳ විසින් කරනු ලැබ ඇති ඉල්ලීම නීතියට අනුකූල නොවන හෙයින් ඉවත ලන මෙන් දෙවැනි පාර්ශ්වකරු විරෝධතාව මගින් අයැද ඇත.

මෙහිදී මා විසින් අවධානය යොමු කළ යුතු කරුණ වන්නේ පළමු පාර්ශ්වකරු වන ඉල්ලුම්කරු මියගොස් ඇත්තේ විභාගයේ කුමන අදියරකදී ද යන්නයි.

පළමු පාර්ශ්වකරු ගේ අසනීප තත්ත්වය මත විවෘත සාක්ෂි විභාගය අවසන් කිරීමට දෙපාර්ශ්වය එකඟ වී ලිඛිත සැලකිරීම් මත විභාගය පවත්වා ගෙන ගොස් අවසාන ලිඛිත දේශන ගොනු කිරීමට නියමිතව තිබියදී පළමු පාර්ශ්වකරු 2022.07.07 දින මියගොස් ඇත. ඒ අනුව නව පාර්ශ්වකරුවකු එක්වී නව හිමිකම් පෑමක් සිදු කිරීමට හෝ අලුතින් කරුණු එක්කාසු කිරීමක් සිදු කිරීමට හෝ මෙම අදියරයේදී අවස්ථාවක් නොමැත.

බේරුම්කරණ විභාගයක් පවතිද්දී නව පාර්ශ්වයක් එක් කිරීමට බේරුම්කරුට බලයක් නොමැති අතර, එසේ වුවද ලේඛන ඉදිරිපත් කිරීමට හෝ පාර්ශ්වකරුවකු වෙනුවෙන් සාක්ෂි ලබාදීමට හෝ අයෙකු කැඳවීමට කාර්මික ආරාවුල් පනත මගින් බේරුම්කරුට බලය ලබාදී ඇත. පළමු පාර්ශ්වකරු මිය යන අවස්ථාව වන විට ආරාවුල් විභාගය අවසන් කර ඇති බැවින් දෙපාර්ශ්වයේ නියෝජිතයන් සාක්ෂි සම්පින්ඩනය කොට ගොනු කර අවසන් දේශන සලකා සුදුසු ප්‍රදානයක් ලබාදීමේ අදියර පමණක් ඉතිරිව පැවතුනි. මෙම ආරාවුලේ ඉල්ලා ඇති සහන වන්නේ නැවත සේවයේ පිහිටුවීම වැනි පාර්ශ්වකරු අත්‍යවශ්‍යයෙන් පෙනී සිටිය යුතු කරුණක් නොවන හෙයින්ද, එකී ඉල්ලීම වන්නේ තමන් සේවය කළ කාලයට අදාළව ලැබිය යුතු යම් මුදලක් ලැබිය යුත්තේ ද යන්න තීරණය කිරීම වන හෙයින්ද, පළමු පාර්ශ්වකරු මියගොස් ඇත්තේ ඊට අදාළ කරුණු සැලකිරීම් සියල්ල අවසන් කිරීමෙන් පසුව වන හෙයින් ද මේ අවස්ථාවේදී ඉදිරිපත්ව ඇති කරුණු සලකා බලා සුදුසු ප්‍රදානයක් ලබා දීමට ඔහුගේ මරණය බාධාවක් නොවන බවට මම තීරණය කරමි. ඒ අනුව පළමු පාර්ශ්වකරු වෙනුවට බිරිඳ ආදේශ කිරීමට කර ඇති ඉල්ලීම සලකා බැලීමට මා හට බලයක් නොමැති බැවින් එය ප්‍රතික්ෂේප කොට ආරාවුලට අදාල අනෙකුත් කරුණු සලකා බලමි.

පළමු පාර්ශ්වය විසින් සිය පළමු සහ දෙවන ලිඛිත සාක්ෂි සම්පිණ්ඩන වාර්තා මගින් පැ. 1 සිට පැ.10 දක්වා ලේඛන ද x1 සිට x6 දක්වා ලේඛන ද ලකුණු කරමින් කරුණු සැල කර සිටින ලදී.

දෙවන පාර්ශ්වය විසින් සිය පළමු සහ දෙවන ලිඛිත සාක්ෂි සම්පිඩන වාර්තා මගින් ව.1 සිට ව.9 දක්වා ලේඛන ලකුණු කරමින් කරුණු සැල කර සිටින ලදී.

පළමු පාර්ශ්වකරු දක්වා ඇති ස්ථාවරය වන්නේ තමන් 2010 වසරේ සිට ජ්‍යෙෂ්ඨ ඖෂධවේදි තනතුරට උසස්වීම් ලබා ඇති බැවින්ද විධිමත් අනුමැතිය මත විශ්‍රාම පූර්ව නිවාඩු නොලබා මාස තුනක කාලය සේවය කර ඇති බැවින් ද මාස තුනක අතර වැටුප් ලැබීමට තමන් පූර්ව හිමිකම් ලබන බවය.
එලෙස විශ්‍රාම පූර්ව නිවාඩු නොලබා සේවය කිරීම සඳහා පළමු පාර්ශ්වකරු 2015 ජනවාරි මස 08 දිනැතිව කරන ලද ඉල්ලීම සභාපතිවරයා විසින් 2015 ජනවාරි මස 13 දිනැතිව අනුමත කර ඇති බවය. (පැ.5 දරන ලිපිය)

සභාපතිවරයාගේ එකී අනුමැතිය ප්‍රකාරව තමන්ට මාස තුනක වැටුප වශයෙන් රුපියල් 75.000 ක ප්‍රදානයක් ද, අනවශ්‍ය නඩු හබ වලට පටලවා සිදුකළ ආර්ථික හා මානසික පීඩනයන් වෙනුවෙන් සාධාරණ හා යුක්ති සහගත වන්දි මුදලක්ද ලැබිය යුතුව ඇතැයි පළමු පාර්ශ්වයේ ස්ථාවරය වී තිබේ.

දෙවන පාර්ශ්වකාර ආයතනයේ ස්ථාවරය වන්නේ 2015 වසරේ සිට මෙම තෙමසක පූර්ව විශ්‍රාම නිවාඩු ලබාදීමේ ක්‍රමවේදය ආයතනය විසින් නවතා ඇති බවයි. (ව.3 ලේඛනය) පළමු පාර්ශ්වකාර ඉල්ලුම්කරු විශ්‍රාමයාමට වර්ෂයකට පමණ පෙර දී, එනම් 2015 ජනාධිපතිවරණය පැවති 2015.01.08 දිනැතිව සභාපතිවරයා අමතා ලියූ ලිපියකින් මෙම විශ්‍රාම පූර්ව නිවාඩු ඉල්ලා තිබූ බව දෙවන පාර්ශ්වකරු කියා සිටී.

2015 ජනවාරි 13 වැනි දින සිය ධුරයෙන් ඉල්ලා අස් වූ සභාපතිවරයා විසින් එදින දාතම සහිතව විශ්‍රාම පූර්ව මාස තුනක රාජකාරිය කිරීමට පළමු පාර්ශ්වකරුට අවස්ථාව අනුමත කර ඇති බව ඉල්ලුම්කරුගේ එකී ලිපියෙහි යොදා ඇති සටහනක දැක්වේ. කෙසේ වෙතත් මෙලෙස වසරකට පසු එළඹෙන දිනයකදී ඇතිවිය හැකි රාජකාරිමය අවස්ථා පූර්ව නිගමනය කොට තීරණ ගැනීම අපහසු බැවින් හා ජනපතිවරණයේ ප්‍රතිඵලය දැනගත් පසුව ඉවත්ව යන සභාපතිවරයාගෙන් වහාම ලිපියක් ලබාගැනීමට ඉල්ලුම්කරු වංක චේතනාවෙන් කටයුතු කර ඇති බව පැහැදිලිවම පෙනී යන බැවින් මෙය වලංගු භාවයෙන් තොර ලිපියක් යන්න දෙවන පාර්ශ්වයේ ස්ථාවරයයි.

ජනාධිපතිවරණයකින් පසු සභාපතිවරයා සේවයෙන් ඉවත්ව යන අවස්ථාවේ මෙම ලිපිය අත්සන් ගැනීම පිළිබඳව දෙවන පාර්ශ්වයේ ස්ථාවරය සම්බන්ධයෙන් ප්‍රති- පිළිතුරු දෙන පළමු පාර්ශ්වකරු කියා සිටින්නේ ව.2හි නිර්ණායකයට අනුව තමන් සිය අයදුම්පත ඉදිරිපත් කර ඇති බවත්, අයදුම් කළ යුතු කාල වකවානුවක් හෝ එය ජනාධිපති මැතිවරණ දිනයක් නොවිය යුතු බවට හෝ එයින් නියමයන් පනවා නොමැති බවයි.

මා මෙහිදී සැලකිල්ලට ගතයුතු කරුණ වන්නේ පළමු පාර්ශ්වකරුවෙකු වෙත ඉල්ලා ඇති සහනය ලබා දීමට දෙවන පාර්ශ්වකාර ආයතනය බැඳී සිටින්නේද යන්නයි. ඒ පිළිබඳව සලකා බැලීමේදී ආයතනයක පරිපාලන ක්‍රියාදාමය මෙන්ම, එහි යුක්තිසහගත පැවැත්මට ප්‍රදානයෙන් සිදු කෙරෙන බලපෑම පිළිබඳවද අවධානය යොමු කළ යුතුය.

පළමු පාර්ශ්වකරු සිය ඉල්ලීමේ ලිපිය සභාපතිවරයාට යොමු කළ බව දැක්වෙන දිනය 2015 වසරේ ජනාධිපතිවරණය පැවති දිනය, එනම් රාජ්‍ය ආයතනවල රාජකාරි සාමාන්‍ය පරිදි සිදු වූ දිනයක් නොවන බව මා හට සැලකිල්ලට ගැනීමට සිදුවෙයි. ඉන් අනතුරුව එළඹුණු දින කිහිපය ද ආයතන මට්ටමෙන් යම් නොසන්සුන් සහ අවිනිශ්චිතභාවයකින් පැවති කාලවකවානුවක් වන අතර ජනවාරි 8 වනදා සිදු වූ දේශපාලන වෙනසෙහි ප්‍රතිඵලයක් ලෙස ජනවාරි දහතුන් වන දා මෙම ආයතනයේද සභාපතිවරයා ඉවත් වී ඇත. එයින් තහවුරු වන්නේ ජනවාරි 8 වනදා සහ ජනවාරි දහතුන් වනදා අතර කාලය ආයතනික පරිපාලන ක්‍රියාවලිය සාමාන්‍ය පරිදි සහ සුමටව ගලා ගිය කාල පරිච්ඡේදයක් නොවන බවයි.

එවන් අවිනිශ්චිත අවස්ථාවකදී ඉල්ලුම්කරු විසින් ඉල්ලීමේ ලිපිය ඉදිරිපත් කරනු ලබන්නේ හදිසි සහ අත්‍යවශ්‍ය කරුණක් නොවන, එනම් වසරකට පසුව එළඹෙන තමන්ගේ විශ්‍රාම පූර්ව කාලසීමාවට අදාළ අනුමැතියක් ලබා ගැනීම සඳහා වීම සාධාරණ පුද්ගලයෙකුගේ දෘෂ්ටිකෝණයෙන් බැලීමේදී සාමාන්‍ය සිද්ධියක් ලෙස සැලකිය නොහැකිය.

එකී අනුමැතිය ලබා ගැනීම ආයතනයේ සාමාන්‍ය ක්‍රියාවලියක් තුළ සිදු වූවක් නොවන බව පළමු පාර්ශ්වකරු තවත් වසරකින් විශ්‍රාම යන දිනය දක්වාම මෙම ඉල්ලීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ නොලැබීම තුළින් තහවුරු වෙයි. ඒ අනුව වසරකට පසු එළඹෙන තත්ත්වයන් පූර්ව නිගමනය කොට, ධුරය හැර යන සභාපතිවරයෙකුගෙන් වහාම ලිපියක් ලබා ගැනීමට ඉල්ලුම්කරු චේතනාවෙන් කටයුතු කර ඇති බවට දෙවන පාර්ශ්වය දරන ස්ථාවරය සමඟ එකඟ වීමට මා හට සිදුවේ.

2016 වසර වන විට කිසිදු විධායක නිලධාරියකුට මාස තුනක පූර්ව විශ්‍රාම නිවාඩු අනුමැතිය හිමි නොවූ හෙයින් ඉල්ලුම්කරුට ද ඒ සඳහා හිමිකමක් නොලැබෙන බවට දෙවන පාර්ශ්වය සිය පළමු ලිඛිත සැලකිරීමෙන් දක්වා ඇති කරුණු ප්‍රමාණවත් ලෙස පළමු පාර්ශ්වය විසින් බිඳ හෙළීමකට ලක් කර නොමැත. එවැනි තත්ත්වයක් යටතේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ පරිපාලන ක්‍රමවේද බිඳහෙළමින් සුවිශේෂී වරප්‍රසාදයක් ඉල්ලුම්කරුට පමණක් හිමිකර දීමේ හැකියාවක් නැත. තවද එවැනි සුවිශේෂී වරප්‍රසාදයක් ඉල්ලුම්කරුට පමණක් ලබාදුනහොත් එය ආයතනයේ තවත් විශාල පිරිසකට බලපෑම් ඇති කරනු ඇති බව මාගේ ස්ථාවරයයි. මන්දයත් ඉල්ලුම්කරුට සැබෑ ලෙසම සිදු වූ අසාධාරණයක් හෝ කාර්මික ආරාවුලක් මේ අවස්ථාවේ පෙනී නොයන බැවිනි.

ඒ අනුව කාර්මික ආරාවුල් පනතේ ප්‍රතිපාදන අනුව මෙම ආරාවුල බේරුම්කරණයට යොමු කළ හැකි ආරාවුලක් නොවන බවට තීරණය කරමි. ඒ අනුව මෙම ආරාවුල බේරුම්කරණය මගින් සමථ කරමින් ප්‍රදානයක් ලබාදීමේ අධිකරණ බලයක් මෙම බේරුම්කරණයට නොමැති බවට තීරණය කරමි.

**ප්‍රදානය**

මෙම ආරාවුල බේරුම්කරණයෙන් සමථ කිරීම සඳහා හෝ බේරුම්කරණ ප්‍රදානයක් ලබා දීම සඳහා මෙම බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බැවින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන අතර ගොනුව අවසන් කිරීමට කටයුතු කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

අරුණ කාන්ත ජයකොඩි,
බේරුම්කරු.

වර්ෂ 2022ක් වූ දෙසැම්බර් මස 04 වැනි දින දී ය.

EOG02 - 0086

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.